

19

# හජ්ජතුල් විදාඃ

"**හජ්ජතුල් විදාඃ**" යනු සමුගැනීමේ හජ් යන අර්ථය දේ. මෙය නබි මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ ජීවිතයේ අවසාන කාල පරිච්ඡේදය තුළ සිදු වූ වැදගත් සිදුවීමකි.

හිජ්රි 10 වන වසරේ දුල් කඃද මස පස්වන දින නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ හජ් වගකීම ඉටු කිරීම සඳහා මක්කාවට යෑමට සූදනම් බව දනුම් දුන්හ. මෙම පුවත සැළ වූ වහා ම බොහෝ ස්ත්‍රී පුරුෂ බොහෝ දෙනෙක් විවිධ ප්‍රදේශවල සිට නබි මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා සමඟ හජ් වගකීම ඉටු කිරීමට සූදනම් වූහ.

අබූ දුජානා රළියල්ලාහු අන්හු තුමා තමා වෙනුවෙන් මදීනාවේ භාරකරු ලෙස පත් කර නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ තම මිත්‍රයින් සමඟ දුල් කඃද 26 වන දින ගමන ආරම්භ කළහ. දුල් හුලෛෆා නම් ස්ථානයේ දී ඉහ්රාම් ඇඳගත් මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ "**තල්බියා**" පවසමින් විශාල ජනකායක් සමඟ මක්කාව බලා පියනැගුවෝ ය. මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමන් කඃබාවට පැමිණි පුවත මක්කාව පුරා පැතිර ගියේ ය. ස්වල්ප වේලාවක් තුල විශාල ජනතාවක් මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ පින්බර මුහුණ දැක ගැනීමේ අදිටනින් උතුරා යන සතුටකින් දිව ආවෝ ය.

''**යවුමුත් තර්වියා**'' නම් වූ දුල්හජ් අට වන බ්‍රහස්පතින්ද දින ලුහා වේලාවේ දී මිනාවට ගියේ ය; 9 වන දින සිකුරාද, එදින අරෆාව බලා පිටත්ව ගියේ ය; හිරු බැස යන තුරු එහි රැඳී සිටි මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පසුව "කස්වා" නමැති තම ඔටුවා පිට නැග "උර්නා" නම් නිම්නයේ මධ්‍යයට ගියහ; එහි දී එක් ලක්ෂ විසි හතර දහසක් පමණ වූ මුස්ලිම්වරුන් මධ්‍යයේ තම ඓතිහාසික ප්‍රසිද්ධ දේශනාව සිදු කළහ.

## නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ හජ් දේශනාව

මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ තම දේශනාව ආරම්භ කරන මොහොතේ මෙය තම ජීවිතයේ අවසාන දේශනාව විය හැකි බව පැවසූහ. ඓතිහාසික වැදගත්කමක් දරන මෙම දේශනාව, නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ වසර 23ක කාල පරිච්ඡේදය තුළ, උපදේශවල සාරාංශය ලෙස පැවති බව පැවසිය හැකි ය. පෞද්ගලිකත්වය, පවුල, සමූහය, ආර්ථිකය, දේශපාලනය, ජීවිතය ප්‍රමුඛ සියලු අංගයන් අන්තර්ගත වන ලෙස මෙම දේශනාව සැකසී තිබීම එහි විශේෂත්වය වේ.

**මෙම දේශනාවේ අන්තර්ගතය මෙසේ ය:**

01. ආදේශයන් තැබීම නම් නින්දිත ක්‍රියාවෙන් මිදී අල්ලාහ්ට පමණක් යටත්ව ජීවත් විය යුතු ය.

02. මිනිසුන් අතර සමානාත්මතාව ආරක්ෂා කර ගත යුතු ය. අරාබි ජනයා අජමි ජනයාට වඩා ශ්‍රේෂ්ඨ අය නොවේ. අජමි ජනයා අරාබි ජනයාට වඩා ශ්‍රේෂ්ඨ අය ද නොවේ. සියල්ලෝ ම ආදම් නබි තුමාගේ දරුවෝ ය. ආදම් නබි තුමා පසෙන් මවනු ලැබුවේ ය.

03. අතීතයේ සිදු කළ ඝාතන වෙනුවෙන් පළි ගැනීමේ ජාහිලියියා කාලයේ සම්ප්‍රදාය සම්පූර්ණයෙන් ම විනාශ කළ යුතු ය. මෙයට ආදර්ශයක් ලෙස නබි තුමාගේ පවුලට අයත් රබීආ බින් හාරිස් තුමාගේ පුතණුවන්ගේ ඝාතනය වෙනුවෙන් පළිගැනීම අවලංගු කර දමන ලදී.

04. පොළිය සම්බන්ධ වන ගනුදෙනු සම්පූර්ණයෙන් ම වළක්වා ගත යුතු ය. මෙයට ආදර්ශයක් ලෙස තම බාප්පා වූ අබ්බාස් රළියල්ලාහු අන්හු තුමාට ලැබීමට නියමිත ව තිබු පොළිය ප්‍රථමයෙන් ම අවලංගු කර දමන ලදී.

05. කාන්තාවන්ට ගරු කර ඔවුන්ගේ හිමිකම් ආරක්ෂා කළ යුතු ය. සැමියා බිරිඳ සමග හැසිරිය යුතු සරල ක්‍රම පිළිබඳව නබි සල්ලල්ලාහු අලෛහිව සල්ලම් තුමාණෝ ජනතාව දැනුවත් කළහ.

06. මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ දේශනාව සිදු වූ දිනය, මාසය,ස්ථානය යනාදිය උතුම් වනවාක් සේ ම මුස්ලිම්වරුන්ගේ ප්‍රාණය, වස්තුව, ගරුත්වය යනාදිය ද උතුම් වේ. එහෙයින් ඒවා ආරක්ෂා කළ යුතු ය.

07. 'අල්කුර්ආනය හා සුන්නාහ්ව පිළිපැදිය යුතු ය. නුඹලා අතර මම කරුණු දෙකක් අතහැර යන්නෙමි. ඒවා පිළිපදින තුරු නොමග නොයන්නෙහු ය. ඒවා නම්, අල්කුර්ආනය හා මගේ මඟපෙන්වීම වන සුන්නාහ්ව' යැයි මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පැවසූහ.

08. මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ උපදෙස් අන් අයට ඉගැන්විය යුතු ය.

මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ දේශනාව පැවැත්වෙන අතර තුර රබීආත් ඉබ්නු උමෛයා නමැති සහාබිවරයා මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ වදන ම විශාල ජනකායට ඇසෙන අයුරින් නැවත වරක් හඬ නගා නිවේදනය කළේ ය. දේශනාව අවසාන වූ විට "මායිදා" නම් පරිච්ඡේදයේ තුන්වන වැකිය පහළ විය. එම වැකිය පහල වූ වහා ම උමර් රළියල්ලාහු අන්හු තුමා අඬා වැළපුණේ ය. මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ එයට හේතුව විමසා සිටියහ. එයට උමර් රළියල්ලාහු අන්හු තුමා "අල්ලාහ්ගේ දූතයාණනි! මේ වන තුරු අපි අපගේ ධර්මයෙහි පරිසමාප්තිය කරා ගමන් කරමින් සිටියෙමු. මේ වන විට එය සම්පූර්ණ වී ඇත. සම්පූර්ණ වූ කිසි දු දෙයක් අසම්පූර්ණ විය නොහැකි නොවේ ද?" යැයි පැවසුවේ ය. එයට මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ "ඔබේ ප්‍රකාශය නිවැරදියි" යැයි පැවසූහ.

ඉන්පසු මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ හජ් හි කටයුතු ඉටු කළහ.  එවිට හජ්හි සෑම ස්ථානයක දී ම ඉටු කළ යුතු සියල්ල සහාබාවරුන්ට පැහැදිලි කළහ.

මදීනාවට පැමිණි මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ දින කිහිපයකට පසුව අසනීප වූහ. හජ් ඉටු කර මාස දෙකහමාරකට පසුව එනම් රබීඋල් අව්වල් 12වන චන්ද්‍ර දින වෆාත් වූහ. හජ් අනිවාර්ය වූ පසු එතුමා ඉටු කළ ප්‍රථම හජ් වන්දනාව එතුමා බලාපොරොත්තු වූවාක් සේ ම එතුමාගේ අවසාන හජ් වන්දනාව ද විය. මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා ඉටු කළ හජ් වන්දනාව **"හජ්ජතුල් විදාඃ" (සමුගැනීමේ හජ්)** යනුවෙන් හඳුන්වනු ලබන්නේ එබැවිනි.

**අභ්‍යාස**

1. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා හජ් වන්දනාව සඳහා යන විට මදීනාවෙහි පත් කළ භාරකරු කවුද?
2. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා ඉහ්රාම් අඳිනු ලැබූ ස්ථානය කුමක් ද?
3. දුල් හජ් 8 වන දිනය හඳුන්වනු ලබන්නේ කෙසේ ද?
4. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ දේශනාව නැවත නිවේදනය කළ සහාබිවරයා කවුද?
5. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ හජ් වන්දනාව "හජ්ජතුල් විදා" යනුවෙන් හැඳින්වීමට හේතුව කුමක් ද?

**ක්‍රියාකාරකම්**

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා හජ්ජතුල් විදාඃ හි දී දේශනා කළ කරුණු ලියා ප්‍රදර්ශනය කරන්න.